# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
## ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ
## පුරප්පාඩු

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පවතින ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු 05ක් සඳහා සුදුස්සන් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. <u>සේවයට බඳවා ගැනීමේ ක්‍රමය</u>

වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ (වෘත්තීය පරීක්ෂණයේදී රිය පැදවීමේ නිපුණත්වය, මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරනු ලැබේ).

### 02. <u>සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි</u>

මෙම තනතුර ස්ථිරය.
මෙම තනතුර සඳහා පත්වීම් ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත් විය යුතුය.

පරිවාස කාලය තුල සිය රාජකාරි, වැඩ හා හැසිරීම, සේවයට පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් සහ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම්, පරිවාස කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2017 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

මෙම බඳවා ගැනීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතින් හි පත් කිරීම සම්බන්ධ පොදු කොන්දේසිද, අංක 1875/39 හා 2014.08.15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7:2 වගන්තියද අදාල වේ.

### 03. <u>වැටුප් පරිමාණය</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරණ වැටුප් චක්‍රලේඛය අනුව PL-03-2016 ,
රු. 25,790 – 10 X 270 - 10 X 300- 10 X 330 – 12 X 350 - 38,990 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.

## 04. සුදුසුකම්

### අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වීම.

### වෘත්තීය සුදුසුකම්

පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර (03) ට පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුයි).

මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

### පළපුරුද්ද

වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය).

### කායික සුදුසුකම්

අවම උස අඩි 05 ක් විය යුතුය.

දිවා කාලයේ හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය.

### වෙනත් සුදුසුකම්

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
3. අයදුම්පත් කැඳවනු ලබන දිනට ඉහත සඳහන් පරිදි පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

### වයස

අවම සීමාව: අවු 18ට නොඅඩු

උපරිම සීමාව: අවු 45ට නොවැඩි

දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, තම අයදුම්පත්‍ර අයදුම් කරනු ලබන තනතුර (ඒකාබද්ධ රියදුරු සේවය III) ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන්කොට 2018.04.20 දින හෝ ඊට පෙර ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, 11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල පිටපත් එවිය යුතු අතර, සහතිකපත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ලැබෙන අයදුම්පත් තේරීමකට භාජනය කරනු ලබන අතර, සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඉහත තනතුරු පිළිබඳ විස්තර www.plantationindustries.gov.lk යන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
11 වන මහල,
සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.
2018.03.22